ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2022/01/10

පැමිණිලි පාර්ශවය : ඩබ්ලිව්.එම්. නීලකාන්ති මිය,
යටිගල්පොත්ත,
ගලේවෙල.

වින්දිත පුද්ගලයා : අතපත්තු ආරච්චිලාගේ ගෙදර මනෝජ් ධනුෂ්ක රාජපක්ෂ

වගඋත්තර පාර්ශවය : 01. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
මල්වතුහිරිපිටිය.

02. ස්ථානාධිපති,
අපරාධ අංශය,
පොලිස් ස්ථානය,
මල්වතුහිරිපිටිය.

<u>පැමිණිලි අංකය : **HRC/2453/18**</u>

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලිකාරිය මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කර ඇති සිය පැමිණිල්ලෙන් ප්‍රකාශ කර ඇත්තේ, තම පුතා වන අතපත්තු ආරච්චිලාගේ ගෙදර මනෝජ් ධනුෂ්ක රාජපක්ෂ යන අය කොළඹ ගලදාරි හෝටලයේ සේවය කරමින් සිටියදී යම් වරදකට මල්වතුහිරිපිටිය පොලිසිය විසින් 2018.10.04 වන දින අත්අඩංගුවට ගෙන ඇති අතර, අධිකරණයට ඉදිරිපත් නොකර දින 05 ක් රඳවාගෙන සිටි බවත්, පැමිණිලිකාරිය පුතා දකින විට දැඩි ශාරීරික පීඩාවන්ට ලක්ව සිටි බවත් සඳහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

වින්දිත පුද්ගලයා වන ජේ.ජේ.පී. මනෝජ් ධනුෂ්ක රාජපක්ෂ යන අයගෙන් ප්‍රකාශ සටහන් කර ගෙන ඇති අතර. එමගින් ඔහු කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ. 2018.10.04 වන දින තමා මිතුරෙක් සමග හිරිපිටිය ජම්බෝලගස් ප්‍රදේශයට ගිය බවත්. එහිදී හිස් වැසුම් පැළඳ නොසිටීම යටතේ මල්වතුහිරිපිටිය පොලිසිය විසින් තමාව අත්අඩංගුවට ගත් බවත්. පසුව පොලිස් නිලධාරින් තමාට පහරදෙමින් මත්ද්‍රව්‍ය පාවිච්චි කරනවාදැයි ප්‍රශ්න කළ බවත්. පසුව අතකට මාංචු දමා එක් මාංචුවක් සිර කුඩුවේ කූරකට දමා තමාව පුටුවක වාඩි කර තැබූ බවත්. එසේ 2018.10.05 වන දින උදේ 10.00 - 11.00 වනතෙක් රඳවා තබා ගත් බවත්. ඒ අතරතුරදී තමාට පහරදුන් බවත්. එමනිසා කකුලේ වළලු කර ලග තුවාල වී තිබූ බවත් සඳහන් කර ඇත. එදින 11.00 - 12.00 ට පමණ තමාට දමා තිබූ මාංචුව බුරුල් වී තිබූ බැවින් එය ගලවාගෙන පොලිසියෙන් පලාගොස් තමා සේවය කළ ගලදාරි හෝටලය වෙත ගිය බවත්. පසුව කොම්පඤ්ඤවීදියේ පිහිටි තමා නවාතැන් ගෙන සිටි ස්ථානයට ගිය බවත්. පසුව 2018.10.09 වන දින උදේ 9.30 ට පමණ කොම්පඤ්ඤවීදියේ පොලිසියෙන් තමාව අත්අඩංගුවට ගෙන කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්. කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානයේ නිලධාරින් තමාට පහර නොදුන් බවත් සඳහන් කර ඇත. එදින සවස 2.30 ට පමණ මල්වතුහිරිපිටිය පොලිසියෙන් පැමිණ තමාව භාරගෙන ජීප් රථයේ දමාගෙන එම පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්. ඒ යන අතරතුරදී ඔළුවට රෙදි කැබැල්ලක් දමා තමාට පහරදුන් බවත්. එදින රාත්‍රියේදී පොලිස් නිලධාරින් තමාගේ ඇග උඩ නගිමින් තමාට අමානුෂික අන්දමින් පහරදීම් කළ බවත් සඳහන් කර ඇත.

2018.10.11 වන දින තමාව අධිකරණය වෙත ඉදිරිපත් කළ අතර. එහිදී තම නීතිඥවරයා පොලිස් නිලධාරින් විසින් තමාට පහරදුන් බවට ගරු මහේස්ත්‍රාත්වරයා වෙත දැනුම්දුන් බවත්. ඒ අනුව තමාට ප්‍රතිකාර ලබාදෙන ලෙසට බන්ධනාගාරය වෙත නියෝග කළ බවත් දක්වා ඇත.

තවද. වින්දිත පුද්ගලයා කොමිෂන් සභාව ඉදිරියේ වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ. බන්ධනාගාරයට ඇතුලත් කරන අවස්ථාවේදී තමාට පහරදුන් බවට ප්‍රකාශයක් ලබාදුන් බවත්. ඒ අනුව බන්ධනාගාර රෝහලෙන් ප්‍රතිකාර ලබාගත් බවත්ය. මාස 09 ක කාලයක් බන්ධනාගාර ගතව සිටි බවත්. පොලිසිය විසින් තමාට විරුද්ධව හෙරොයින් මි.ග්‍රෑ. 2300 ක් ලග තබා ගැනීම යටතේ සහ යතුරු පැදියක් සොරා ගැනීම යටතේ පවරා තිබූ නඩු සඳහා තමා වරද පිළිගත් බවද ප්‍රකාශ කර ඇත.

පැමිණිල්ල තහවුරු කිරීම සඳහා පවතින සාක්ෂි :-

මහර බන්ධනාගාර අධිකාරිවරයාගෙන් වාර්තාවක් කැඳවා ඇති අතර. එහි සඳහන් වන්නේ 2018.10.11 වන දින මනෝජ් ධනුෂ්ක රාජපක්ෂ යන අයව බන්ධනාගාර ගත කොට ඇති බවත්.

බන්ධනාගාරයට ඇතුළත් වන අවස්ථාවේදී ඔහුට පොලිසිය විසින් පහරදුන් බවට ප්‍රකාශ කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් බන්ධනාගාර රෝහල මගින් ප්‍රතිකාර ලබාගෙන ඇති බවත්ය.

එම වාර්තාව සමග බන්ධනාගාර රෝහලේ කාර්ය භාර නිලධාරියා විසින් වාර්තාවක් ලබාදී ඇති අතර, එහි දක්වා ඇත්තේ, 2018.10.12 වන දින වින්දිතයා විසින් පොලිස් පහරදීමක් සිදුකර ඇති බව පවසමින් රෝහල් ගත වී ඇති බවත්, ඇගපතේ වේදනාව සහ සුළු තුවාල සහිතව ඇතුළත්වී ඇති බවත්ය. නමුත් ප්‍රතිකාර ලබාදීමට තරම් රෝගී තත්ත්වයක් නොමැති බැවින් රෝහලෙන් පිට කර ඇති බවත් දක්වා ඇත.

එසේම, වින්දිතයා බන්ධනාගාරයට ඇතුළත් කරන විට කරන ලද ප්‍රකාශයේ ද තමාට මල්වතුහිරිපිටිය පොලිසියෙන් පහරදුන් බවට සඳහන් කර ඇති බවද දක්වා ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

- **01 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

පළවන වඋත්තරකරු කොම්පන් සභාව වෙත වාර්තාවක් ලබාදී ඇත. එම වාර්තාව අනුව 2018.10.05 වන දින ස්ථානයට වාර්තා වූ රු. 235,000.00 වටිනා යතුරු පැදියක් සොරකම් කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කරගෙන යන අතරතුර 2018.10.10 වන දින මනෝජ් ධනුෂ්ක රාජපක්ෂ යන අයව තමා විසින් යොදන ලද මාර්ග බාධකයේදී අත්අඩංගුවට ගත් බවත්, එම අවස්ථාවේදී ඔහු ලග තිබී හෙරොයින් මි.ග්‍රෑ. 2500 ක් සොයා ගත් බවත් සඳහන් කර ඇත.

යතුරු පැදිය සොරකම් කිරීම සම්බන්ධයෙන් ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී 2162/18 යටතේ අධිකරණයට කරුණු වාර්තා කළ බවත්, පසුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 69698/18 යටතේ චෝදනා ගොනු කර එම නඩුවේදී වරද පිළිගෙන ඇති බවත් දක්වා ඇත. සැකකරුට 2019.02.13 වන දින රු. 1500.00 දඩයක් සහ වසරක බරපතල සිර දඬුවම් අවුරුදු 05 කට අත්හිටුවා ඇති බවත්, ඊට අමතරව රු. 10000.00 ක වන්දි මුදලක් ගෙවීමටද නියම කර ඇති බවත් දක්වා ඇත.

සැකකරු සන්තකයේ තිබී සොයා ගන්නා ලද හෙරොයින් සම්බන්ධයෙන් 79920/19 යටතේ චෝදනා ගොනු කර ඇති බවත්, එම නඩුවෙන්ද වරද පිළිගෙන 2019.07.02 රු. 6000.00 ක දඩයකට යටත් කර ඇති බවද දක්වා ඇත.

- **02 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

02 වන වගඋත්තරකාර උ.පො.ප. ඩබ්ලිව්.එම්.ආර්. බණ්ඩාර යන අය කොමිසන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකාරියගේ පුතා වන ධනුෂ්ක රාජපක්ෂ යන අය 2018.10.04 වන දින යතුරු පැදියක් සොරකම් කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන සිටියදී පොලිසියෙන් පලා යනවිට එම ප්‍රදේශයේ නවතා තිබූ යතුරු පැදියක් ද සොරකම් කරගෙන ඒ මගින් පලාගොස් ඇති බවත්, පසුව කොම්පඤ්ඤවීදිය පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට භාරදීමෙන් පසුව 2018.10.11 වන දින අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති නඩු වලින් අධිකරණයේදී වරද පිළිගෙන දඬුවම් ලබාදී ඇති බවත්ය. තවද, පොලිසිය විසින් කිසිදු පහරදීමක් නොකළ බවද සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :-**

වින්දිතයා විසින් අධිකරණයේදී ඔහුට විරුද්ධව තිබූ නඩු වලදී වරද පිළිගෙන දඬුවම් ලබා ඇති අතර, තමාට පොලිසියෙන් පහරදුන් බවට අධිකරණයේදී ගරු මහේස්ත්‍රාත්තුමා දැනුවත් කොට ඇති බවත්, ඒ අනුව බන්ධනාගාරයෙන් ප්‍රතිකාර ලබාදෙන ලෙසට නියෝග කර ඇති බවත් නිරීක්ෂණය වේ.

බන්ධනාගාර වාර්තාවට අනුව පහරදුන් බවට වින්දිතයා විසින් ප්‍රකාශයක් ලබාදී ඇත. එසේම, සුළු තුවාල සහිතව ප්‍රතිකාර සඳහා රෝහලට ඇතුලත් වූ බවට වෛද්‍යවරයා කොමිෂන් සභාව වෙත වාර්තා කොට ඇති අතර, ප්‍රතිකාර කිරීමට තරම් රෝගී තත්ත්වයක් නොතිබූ නිසා රෝහලෙන් පිටත් කර ඇති බව ද දන්වා ඇත.

පැමිණිල්ල ඉදිරිපත් කර ඇති නඩු වාර්තා වලදී මල්වතුහිරිපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා තමා විසින් සැකකරුව 2018.10.10 දින අත්අඩංගුවට ගත් බවට සඳහන් කොට ඇති බව නිරීක්ෂණය වේ.

නමුත්, උ.පො.ප. බණ්ඩාර යන අය කොමිසන් සභාවේදී ප්‍රකාශ කර ඇත්තේ, 2018.10.04 දින අත්අඩංගුවට ගෙන සිටියදී සැකකරු පොලිසියෙන් පැන ගොස් ඇති බවත්, නැවත 2018.10.10 දින කොම්පඤ්ඤවීදිය පොලිසියෙන් අත්අඩංගුවට ගෙන ඇති බවත්ය. ඒ අනුව සැකකරුව කොම්පඤ්ඤවීදිය පොලිසියෙන් 2018.10.10 දින අත්අඩංගුවට ගත් බවට නිරීක්ෂණය වේ.

නිගමනය :-

වින්දිතයා කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශයට අනුව, 2018.10.04 වන දින ඔහුව අත්අඩංගුවට ගෙන ඇත්තේ හිස් වැසුම් පැළඳ නොසිටීම යටතේ බව ප්‍රකාශ කරන බැවින්ද, ඉන්පසුව එදිනම මල්වතුහිරිපිටිය පොලිස් අත්අඩංගුවේ සිටියදී පලාගිය බව පිළිගන්නා බැවින් ද, 2018.10.04 වන දින අත්අඩංගුවට ගැනීම සහ 2018.10.10 වන දින අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූල අත්අඩංගුවට ගැනීමක් බව නිගමනය කළ හැකිය. ඒ අනුව ඉහත කරුණු සලකා බැලීමේදී 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13(1) සහ 13(2) ව්‍යවස්ථාවන් උල්ලංඝනය වීමක් සිදුවී නොමැත.

නමුත්, වින්දිතයාගේ ප්‍රකාශයෙන් හා බන්ධනාගාර වාර්තා අනුව පැමිණිලිකරුට පහරදීමක් සිදුවී ඇති බවට තහවුරු වන බැවින්, 11 වන ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුවී ඇත.

සිල්වා එදිරිව ලංකා වාණිජ තෙල් නීතිගත සංස්ථාව නඩුවේදී යම් ක්‍රියාකලාපයක් 11 වන ව්‍යවස්ථාව යටතේ කඩ කිරීමක් බවට පත්කිරීමට නම් එම ක්‍රියාව අධිකරණය විසින් සැලකිල්ලට ගත හැකි වර්ගයේ ක්‍රියාවක් මිස අන් ආකාරයේ ක්‍රියාවක් නොවිය යුතු බව දක්වා ඇත. ඒ අනුව අධිකරණය යෝජනා කර ඇත්තේ එම ක්‍රියාව බරපතල සැරපරුෂභාවයක් තිබිය යුතුය යන්නයි. නමුත්, පසුකාලීන නඩු වලදී හා 1994 අංක 22 දරණ වධහිංසා හා කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම් වලට එරෙහිව සම්මුති පනතේ වධහිංසාව යන වචනයෙහි අර්ථ නිරූපනය සලකා බැලීමේදී මෙම පනතේ 12 වන වගන්තිය මගින් වධ දීම පහත ආකාරයට අර්ථ නිරූපනය කර ඇත.

වධදීම යන්න වෙනයම් තැනැත්තෙකුට දැඩි ශාරීරික හෝ මානසික වේදනා ගෙන දෙන්නා වූවද, පහත සඳහන් කාර්යයන් සඳහා එනම්, එකී වෙනත් තැනැත්තන් හෝ තුන්වන තැනැත්තෙකුගෙන් යම් තොරතුරක් හෝ පාපොච්චාරණයක් ලබාගැනීම හෝ එකී තැනැත්තන් කරන ලද හෝ කරන ලද යැයි සැක කෙරෙන යම් ක්‍රියාවක් සඳහා දඬුවම් කිරීමක් හෝ එකී තැනැත්තෙකුව බියගැන්වීම හෝ ඔහුට බල කිරීම හෝ වෙනස්කම් කිරීම පදනම් වූ හේතුවක් නිසා වුවද විය හැකිය.

එසේම, ඇන්සලින් ප්‍රනාන්දු එරෙහිව සරත් පෙරේරා සහ තවත් අය නඩුවේදී ප්‍රබල වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමට අනෘප්තියට පත් පාර්ශවයන්ට නොහැකිවීම නිසා එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම සුදුසු නොවන බව ද අධිකරණය පෙන්වා දී ඇත.

තවද, <u>සරත් කුමාර එරෙහිව කල්දේරා SC(FR) 124/95</u> නඩුවේදී ද දක්වනුයේ වෛද්‍ය වාර්තාවත් පෙත්සම්කරුගේ පැමිණිල්ල සමග සර්ව සම්පූර්ණයෙන්ම නොසැසඳෙන අවස්ථාවන් හිදී සලකා බැලිය යුතු කරුණ වනුයේ එම වෛද්‍ය විද්‍යාත්මක සාක්ෂි සියල්ලම එක්ව ගත් කල පෙත්සම්කරුගේ විස්තරයට සහයෝගය දක්වන්නේ ද යන බවය. මන්ද යත්, වෛද්‍ය විද්‍යාත්මක සාක්ෂි වින්දිතයා විසින් පවසන ලද තොරතුරු වල තීරණාත්මක ස්වභාවය විය යුතු නොවන නිසා බව දක්වයි.

එසේම, <u>ඉෂාරා අංජලී එරෙහිව වරුණී බෝගහවත්ත</u> නඩුවේදී ද 11 වන ව්‍යවස්ථාව තවදුරටත් පුළුල් කරමින් නීතිය බලාත්මක කිරීමේ නිලධාරින් මානව ගරුත්වය අගය කිරීම ආරක්ෂා කිරීම, සෑම පුද්ගලයෙකුගේම මානව හිමිකම් පවත්ගෙන යාමට හා ආරක්ෂා කිරීමට බැඳී සිටින බැවින් ද එම මානුෂික මූලධර්මයන්ට ගරු කළ යුතු බවත්, එසේම නීතිය බලාත්මක කිරීමේ නිලධාරින් කිසිදු තත්ත්වයක් යටතේ වධ හිංසා පැමිණවීමක් හෝ වෙනත් කෲර අමානුෂික හෝ පහත ලෙස සැලකීමක් නොකළ යුතු බවට දක්වා ඇත.

ඒ අනුව ඉහත කරුණු සලකා බැලීමේදී වගඋත්තරකාර පාර්ශවය විසින් වින්දිතයාගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කොට ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට තවදුරටත් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. එබැවින් මෙම පැමිණිල්ලට අදාළ කාල වකවානුවේදී මල්වතුහිරිපිටිය පොලිස් ස්ථානයේ සේවය කරන ලද 01 සහ 02 යන වගඋත්තරකාර පාර්ශවයන් විසින් වින්දිත පුද්ගලයා වෙත වන්දි වශයෙන් රු. 10,000/- ක මුදලක් ගෙවීමට නිර්දේශ කටයුතු කළ යුතුය.

02. තවද, වගඋත්තර පාර්ශවයේ මෙකී ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා සහ මෙම නිර්දේශය අදාළ කාල වකවානුව තුළ මල්වතුහිරිපිටිය පොලිස් ස්ථානයේ සේවය කරන ලද වගඋත්ත පාර්ශවය වෙත යොමු කිරීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති, පොලිස් මානව හිමිකම් කොට්ඨාශයෙහි අධ්‍යක්ෂ සහ නීතිපතිතුමා වෙත ද යොමු කරනු ලැබේ.

2022. 02. 10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම්, පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වා සිටිමු.

අනූෂා ෂණ්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. An... a Shanmu... athan
Commissioner
Human Rights Commission of Sri Lanka

ම.හේ.නිමල් කරුණාසිරි.
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත් : 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. අධ්‍යක්ෂ (නීති),
පොලිස් මානව හිමිකම් කොට්ඨාශය,
අංක : 7, 7 වන මහල,
කොටා පෙරේරා, කොළඹ 08.

03. නීතිපතිතුමා,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

(01–03) ඉහත දෙවන නිර්දේශය අනුව කටයුතු කිරීම සඳහා.

සැලකිය යුතුයි : අදාල මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

ස/-